වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය
வருடாந்த அறிக்கையும் நிதிக்கூற்றும்
ANNUAL REPORT & STATEMENT OF ACCOUNTS

2021

හානිපූරණය සඳහා වන කාර්යාලය - ශ්‍රී ලංකාව
இழப்பீடுகளுக்கான அலுவலகம் - இலங்கை
OFFICE FOR REPARATIONS - SRI LANKA

අංක. 408, ගාලු පාර, කොළඹ - 03.
இல. 408, காலி வீதி, கொழும்பு- 03.
No. 408, Galle Road,Colombo – 03.

හානිපූරණය සඳහා වන කාර්යාලය
ශ්‍රී ලංකාව
වාර්ෂික වාර්තාව **2021**
(මූල්‍ය ප්‍රකාශන සඳහා)

හානිපූරණය සඳහා වන කාර්යාලය - ශ්‍රී ලංකාව
අංක 408
ගාලු පාර
කොළඹ 03.

හානිපූරණය සඳහා වන කාර්යාලය
2021 වර්ෂය

1. හැඳින්වීම

හානිපූරණය සඳහා වන කාර්යාලයට අදාල (හානිපූරණ කාර්යාලය) ව්‍යවස්ථාපිත විධි නියෝගයන් ක්‍රියාවට නැංවීම අරමුණු කරගෙන සමාලෝචිත වර්ෂය තුල දී ද එම කාර්යාලයේ මෙහෙයුම් කටයුතු නොකඩවා සිදු කරන ගෙන යන ලදී. හානිපූරණ කාර්යාලයේ දෙවන වසර මාර්තු මස දී නිමා කරමින් තෙවන වසර ආරම්භ කිරීමත් සමඟම, මෙම කාර්යාලය විසින් පීඩාවට පත් ප්‍රජාවන්ගේ අවශ්‍යතා පිළිබඳ වඩාත් පුළුල් අවබෝධයක් සහිතව එහි වැඩසටහන් නිර්මාණය කිරීමට හැකි විය. ඒ හානිපූරණය කාර්යාලය පීඩාවට පත් තැනැත්තන්හට සේවාවන් ලබා දීම සඳහා කැප වී සිටින බැවිනි.

2018 අංක 34 දරන හානිපූරණය සඳහා වන කාර්යාලය පනතේ වගන්ති අංක 02 ප්‍රකාරව හානිපූරණ කාර්යාලයේ අරමුණු පහත පරිදි වේ-

(1) පීඩාවට පත් තැනැත්තන්ට තනි සහ සාමූහික හානිපූරණය පිළිබඳ ප්‍රතිපත්තීන් විධිමත්ව සකස්කර අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ කිරීම;
(2) මහජන අධ්‍යාපනය, අනුස්මරණය කිරීම සහ ළමයින්, තරුණයන්, කාන්තාවන් සහ ලිංගික හිංසනයට ලක් වූ වින්දිතයන් සහ දුබලතාවයන් සහිත තැනැත්තන් සම්බන්ධයෙන් වන විශේෂිත ප්‍රතිපත්ති ඇතුළුව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද එම හානිපූරණය සඳහා වන ප්‍රතිපත්ති සඳහා පහසුකම් සැපයීම සහ ක්‍රියාත්මක කිරීම;
(3) ප්‍රතිසන්ධානය අරමුණු කරගත් වෙනත් යාන්ත්‍රණයන් සමඟ අනුකූල වීම තහවුරු කිරීම සඳහා සබඳතා පිහිටුවීම; සහ
(4) යෝග්‍ය පීඩාවට පත් තැනැත්තන්ට හානිපූරණයන් ලබා දීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ අගය කිරීම.

2. හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයින්

සමාලෝචිත වර්ෂය තුල දී හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයින් පහත පරිදි වේ:

1. ධාරා විජයතිලක මහත්මිය - සභාපතිනි
2. ජේ.එම්.ස්වාමිනාදන් මහතා - සාමාජික
3. ඒ.ඒ.එම්. ෆාතිහූ මහතා - සාමාජික
4. සෙල්ලතම්බි සුමිත්‍රා මෙනවිය - සාමාජික
5. මේජර් ජනරාල් (විශ්‍රාමික) පාලිත ප්‍රනාන්දු - සාමාජික (2021 මැයි 24 දින සිට පත්වීම් ලබා ඇත)

හානිපූරණ කාර්යාලයේ ලේකම් කාර්යාලය අධ්‍යක්ෂ ජනරාල්වරයකු විසින් මෙහෙයවනු ලබන අතර එහි රාජකාරි කටයුතු සඳහා සහාය වීමට කාර්ය මණ්ඩලයක් සිටී. 2019 අප්‍රේල් මස ආරම්භයේ සිට වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු අර්ධ කාලීනව හානිපූරණය කාර්යාලයේ රාජකාරි කටයුතු කළ අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස අපේක්ෂිත අරමුණු ළඟා කරගැනීමෙහිලා එය බාධාවක් විය. නමුත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීවරියක් ද්විතීක පදනම මත 2021 අගෝස්තු 02 දින සිට හානිපූරණය සඳහා වන කාර්යාලයේ පළමු පූර්ණ කාලීන අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස බඳවා ගැනීමට හැකි විය.

3. සමාලෝචිත වර්ෂය තුල දී සිදු කරනු ලැබූ ක්‍රියාකාරකම්

හානිපූරණයන් ප්‍රදානය කිරීම සඳහා හානිපූරණ කාර්යාලය විසින් සකස් කරනු ලැබූ හානිපූරණ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන් 2021 අගෝස්තු මස 17 දිනැතිව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මේ මඟින් ප්‍රතිපත්ති අනුමැතිය ලබා ගැනීම සඳහා වන ව්‍යවස්ථාපිත ක්‍රියාවලිය සම්පූර්ණ වන අතර, හානිපූරණ කාර්යාලයේ වැඩසටහන් සඳහා මෙය පදනමක් සපයනු ලබයි. පනතෙහි සඳහන් කර ඇති පරිදි හානිපූරණ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් අදාල පියවර ගෙන ඇත.

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තීන්හි පීඩාවට පත් තැනැත්තන් වෙත හානිපූරණයන් ප්‍රදානය කිරීම සඳහා අදාල මැදහත්වීම්වල ප්‍රධාන තේමා ක්ෂේත්‍රයන් අටක් (08) ක් සහ අනුගමනය කළ යුතු මාර්ගෝපදේශයන් දහයක් (10) ක් හඳුනාගෙන ඇත.

මැදිහත්වීම් සඳහා වන ප්‍රධාන තේමා ක්ෂේත්‍රයන්

I. ජීවනෝපාය සහාය
II. මූල්‍යමය වන්දි ආධාර
III. ඉඩම් අයිතීන් නැවත ලබාදීම සඳහා සහාය
IV. නිවාස සැපයීම සඳහා සහාය
V. ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය
VI. පරිපාලන සහන
VII. මනෝසාමාජීය සහාය
VIII. සමඟිය, සංහිඳියාව හා ප්‍රචණ්ඩත්වය නැවත ඇති නොවීම සඳහා පියවර

හානිපූරණයන් තීරණය කිරීමේ දී සැලකිල්ලට ගනු ලබන මාර්ගෝපදේශයන් 10

1. චින්දිත කේන්ද්‍රීයතාව - පීඩාවට පත් තැනැත්තන් සඳහා වඩාත්ම හොඳ දේ කුමක් ද යන්න මත පදනම්ව සියලු තීරණ ගනු ඇත.
2. පීඩාවට පත් තැනැත්තන්ට හානිපූරණයන් ලබා ගැනීමට යෝග්‍යතා සඳහා වන නිර්ණායක.
3. යෝග්‍ය පීඩාවට පත් තැනැත්තන් වෙත සපයනු ලබන හානිපූරණයන්ගේ ආකාරය සහ උචිත අවස්ථාවන්හි දී ඒවා සපයනු ලබන ප්‍රමාණය
4. මූල්‍යමය වන්දි සඳහා පීඩාවට පත් තැනැත්තන්ගේ යෝග්‍යතාවය තීරණය කිරීම සඳහා වන නිර්ණායක
5. නොපමාව ලබා දිය යුතු හානිපූරණයන් සඳහා පීඩාවට පත් තැනැත්තන්ගේ යෝග්‍යතාවය පිළිබඳ නිර්ණායක
6. පීඩාවට පත් තැනැත්තන්ට විවිධ ආකාරයේ හානිපූරණයන් සැපයීම හෝ ලබා දීම සඳහා සහාය විය හැකි මණ්ඩලයන්
7. සත්‍යාපනය කරන ලද හානිපූරණය සඳහා වන ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට පදනම් කරගත යුතු නිර්ණායක
8. තත්‍යභාවය සත්‍යාපනය කිරීමේ නිර්ණායක
9. මියගිය තැනැත්තන් අනුස්මරණය කිරීම හා ස්මාරක සඳහා වන නිර්ණායක
10. පීඩාවට පත් විශේෂ කණ්ඩායම්වල විශේෂ අවශ්‍යතා සපුරාලීම

හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් සිදු කරන ලැබූ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පහත පරිදි වේ

3.1 ජීවනෝපාය සහාය

පීඩාවට පත් ප්‍රජාවන්ගේ ජීවන මට්ටම වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව නව ආරම්භක වැඩසටහන් සහ ව්‍යවසායකත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවස්ථාව සලසමින් හානිපූරණ කාර්යාලය විසින් දැනුම සහ තාක්ෂණ හුවමාරු වැඩසටහනක් සංවර්ධනය කරන ලදී. දේශීයව පවතින සම්පත් භාවිත කරමින් නව ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා පීඩාවට පත් තැනැත්තන්හට අවශ්‍ය දැනුම ලබා දීමේ අරමුණ ඇතිව මෙම වැඩසටහන නිර්මාණය කර ඇත. මේ තුළින් පීඩාවට පත් තැනැත්තන් සාම්ප්‍රදායික කර්මාන්තවල නිරත වීමට වඩා වෙළඳපොළෙහි වැඩි තරහකාරීත්වයක් ඇති නව අවස්ථා ගවේෂණය කිරීමට ඔවුන්ට ඉඩ ප්‍රස්තාව සලසනු ඇත.

ඒ අනුව පළමු දැනුම සහ නාක්ෂණ හුවමාරු වැඩසටහන 2021 දෙසැම්බර් මස යාපනය දිස්ත්‍රික්කයේ තෙල්ලිපලෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කාන්තා ගෘහ මූලිකයින් සඳහා පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා කාන්තාවන් එකසිය දෙදෙනෙකු (102) සහභාගී වූ අතර, මෙහිදී දේශන මෙන්ම පිරිසිදු පොල්තෙල් පිරිපහදුව, දියර සබන් වර්ග සැකසීම ආදී නව අවස්ථාවන් පිළිබඳ ප්‍රායෝගික නිරූපණයන් ද සිදු කරන ලදී. නව ව්‍යාපාරික අවස්ථාවල නියැලීමට කැමති ප්‍රතිලාභීන්හට උපකාර කිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු මේ වනවිට සම්බන්ධීකරණය කරමින් පවතී.

3.2 වන්දි සහ මූල්‍යමය සහාය:

සමාලෝචිත වර්ෂය තුල දී, හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් හිමිකම් 5,964ක් වන්දි ගෙවීම් සඳහා සකසනු ලැබූ අතර, උතුරු නැගෙනහිර පළාත්වල සිදු වූ ගැටුම් සහ 2006 සහ 2019 වර්ෂ අතරතුර සිදු වූ සිදුවීම් 07ක් හේතුවෙන් සිදු වූ මරණ, ශාරීරික තුවාල හා දේපල හානි සඳහා වන්දි වශයෙන් රු. මිලියන 399.8 ක මුදලක් වන්දි ලෙස ප්‍රදානය කරන ලදී.

2021 වර්ෂයේ වන්දි ගෙවීම් - ප්‍රධාන අංග

	අයිතම	ප්‍රමාණය
1	"පුනරාවර්තන වියදම්" සඳහා මුළු අයවැය වෙන් කිරීම	රු. 900 මිලියන
2	"පුනරාවර්තන වියදම්" අයවැයෙන් වන්දි ගෙවීම් සඳහා අභ්‍යන්තර වශයෙන් වෙන් කරන ලද මුළු ගණන	රු. 800 මිලියන
3	මුළු පුනරාවර්තන වියදම් අයවැයෙන් අභ්‍යන්තර වෙන් කිරීම (මිලියන 800) ප්‍රතිශතයක් ලෙස	88.9%
4	2021 ජනවාරි 01 දිනට හානිපූරණ කාර්යාලයේ වන්දි සඳහා සැකසීමට තිබූ හිමිකම් අයදුම්පත් ගණන	12,262
5	සමාලෝචිත වසර තුළ දී ලැබුණු නව අයදුම්පත් ගණන	5,827
6	2021 ජනවාරි 01 දිනට ගෙවීම් සඳහා අනුමත කරන ලද සහ ගෙවා අවසන් කිරීම සඳහා තිබූ හිමිකම් අයදුම්පත් ගණන	2,950
7	සමාලෝචිත වසර තුළ දී වන්දි සඳහා සකස් කරන ලද සහ ගෙවීම් සඳහා අනුමත කරන ලද හිමිකම් අයදුම්පත් ගණන	3,208
8	ගෙවා අවසන් කරන ලද හිමිකම් ගණන	5,964
9	හිමිකම් අයදුම්කරුවන් 5,964 දෙනෙකුට ගෙවන ලද මුළු මුදල	රු. 399.8 මිලියන
10	වසර අවසානයේ දී ගෙවීම් සඳහා අනුමත කරන ලද සහ ගෙවා අවසන් කිරීමට තිබූ හිමිකම් ගණන	194
11	වසර අවසාන වන විට ගෙවීම් සඳහා අනුමත කරන ලද ගෙවා අවසන් කිරීමට අවශ්‍ය මුළු මුදල	රු. 7.9 මිලියන

2021 වසර තුල වන්දි ගෙවීම් සඳහා රු. මිලියන 800 ක මුදලක් වෙන් කළ ද, කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් දිගින් දිගටම රට අගුළු දැමීම් සහ සංචරණ සීමා පැනවීමට සිදු වීම නිසා එහි ප්‍රතිඵලයක් ලෙස හිමිකම් ලිපිගොනු සැකසීමේ කටයුතු සඳහා බාධා විය.

වන්දි ගෙවීම්වලට අමතරව, පුනරුත්ථාපන අධිකාරිය විසින් ආරම්භ කරන ලද ණය වැඩසටහනක් ද හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් නොකඩවා සිදු කරගෙන යන ලදී. මහා භාණ්ඩාගාරය විසින් ලංකා බැංකුව වෙත නිදහස් කරන ලද මුදල් එම බැංකුව මඟින් ණය වශයෙන් ලබා දෙන ලදී. මෙම ණය ලබා දීම සඳහා යෝග්‍ය ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ දී හානිපූරණ කාර්යාලයේ නිලධාරීන් සහ බැංකු නිලධාරීන් විසින් අයදුම්කරුවන්ව ඇගයුම් කිරීම සහ නිර්දේශ කිරීම කරනු ලබයි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ස්වයං රැකියා අවස්ථාවන් සඳහා සහ නිවාස ආධාර ලෙස පීඩාවට පත් තැනැත්තන් වෙත මූල්‍යමය සහාය ලබා දෙනු

ලබයි. තවද, සමාජගත කරන ලද අභ්‍යාසලාභීන් සඳහා ද ස්වයං රැකියා සඳහා ණය ලබා දෙනු ලබයි. මෙහිදී, වාර්ෂික පොලී අනුපාතය 2% කට රු. 250,000 ක උපරිම ණය මුදලක් මෙම යෝජනා ක්‍රම යටතේ ලබා දෙනු ලබයි. ඉහත ණය යෝජනා ක්‍රමයන්හි ප්‍රගතිය පහත පරිදි වේ:

ණය යෝජනා ක්‍රමය	2021 වසර තුළ දී ණය ලැබීම සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් නිර්දේශ කරන ලද ගණන	2021 වසර තුළ දී ලංකා බැංකුවෙන් ණය ලබා ගත් ප්‍රතිලාභීන් ගණන	ණය වශයෙන් ලබා දෙනු ලැබූ මුදල (රු.)
පීඩාවට පත් තැනැත්තන් සඳහා ස්වයං රැකියා ණය ආධාර	211	206*	43,200,000
පීඩාවට පත් තැනැත්තන් සඳහා නිවාස ආධාර	65	65	16,250,000
සමාජගත කරන ලද අභ්‍යාසලාභීන් සඳහා ස්වයං රැකියා සඳහා ආධාර	20	18	4,450,000
එකතුව	**296**	**289**	**63,900,000**

***** 2020 වසර තුළ දී නිර්දේශ කරන ලද ප්‍රතිලාභීන් ගණන ද මෙයට අයත් වේ.

ප්‍රතිලාභීන්ට ඇපකර ඉදිරිපත් කිරීමට ඇති අපහසුතාවය හේතුවෙන් හානිපූරණ කාර්යාලය විසින් ණය ලබා දීමට නිර්දේශ කරන ලද සියළු ප්‍රතිලාභීන්හට ණය ලබා දීමට බැංකුවට හැකියාවක් නොමැති බව නිරීක්ෂණය විය. ස්වයං රැකියා ව්‍යාපෘති අලුතින් ආරම්භ කිරීමට හෝ දැනට කර ගෙන යන ස්වයං රැකියා නොකඩවා කර ගෙන යෑම සඳහා මූල්‍යමය සහාය අවශ්‍ය තැනැත්තන්හට වඩාත් හොඳ ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා දැනට ක්‍රියාත්මක යෝජනා ක්‍රමය ප්‍රතිනිර්මාණය කිරීමේ අරමුණින් සාකච්ඡාවන් පවත්වන ලදී.

3.3 ඉඩම් අයිතිය නැවත පැවරීම; නිවාස සහාය ලබා දීම, ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය; පරිපාලන සහාය

දැනටමත් දිස්ත්‍රික් මට්ටමින් බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති හෙයින්, එම වැඩසටහන්වල ඇති හිඳැස් හඳුනා ගැනීම සඳහා හානිපූරණ කාර්යාලය දිස්ත්‍රික් පරිපාලනය සමඟ එක් ව කටයුතු කිරීම පිළිබඳව සැලකිල්ලට ගන්නා ලදී. මේ අරමුණින්, හානිපූරණ කාර්යාලයේ කාර්යභාරය සහ විධිවිධානයන් පිළිබඳව දැනුවත් කිරීමටත් අවශ්‍ය සහාය පිළිබඳව සාකච්ඡා කිරීමටත් දිස්ත්‍රික්ක 25හිම දිස්ත්‍රික් ලේකම්වරුන් සමඟ හමුවක් පවත්වන ලදී. තවද, පීඩාවට පත් ප්‍රජාවන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තොරතුරු එක් රැස් කිරීම සඳහා හානිපූරණ කාර්යාලය විසින් ප්‍රශ්නාවලියක් බෙදා හරින ලදී. අනතුරුව, අදාල වැඩසටහන් සඳහා එකී අවශ්‍යතාවයන් ඇතුළත් කිරීමේ හැකියාවක් තිබේ ද යන්න සොයා බැලීම සඳහා අදාල රාජ්‍ය ආයතන සමඟ සාකච්ඡා පවත්වනු ඇත.

3.4 මනෝසාමාජීය සහාය

ගැටුම් හේතුවෙන් පීඩාවට පත් තැනැත්තන්ට එම ගැටුම් නිසා සිදු වූ බලපෑම අතිමහත් බව හඳුනා ගෙන ඇති අතර, ඒ වෙනුවෙන් පිළියම් ලබා දීමට ඇති අවශ්‍යතාවය විශේෂයෙන්ම සැලකිල්ලට ඉඳුන් කර ඇත. මේ සඳහා මනෝසාමාජීය සහාය නියමු වැඩසටහනක් නිර්මාණය කර ඇති අතර, ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දී සිද්ධි කලමනාකරුවන් 26 දෙනෙකු පුහුණු කරන ලදී. මෙකී පුහුණුව ජාත්‍යන්තර වශයෙන් පිළිගත් මූලධර්මයන්ට සහ ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන ලදී. වරින් වර පැවති කොවිඩ්-19 නීති සහ සෞඛ්‍ය මාර්ගෝපදේශ හේතුවෙන් මෙම පුහුණු වැඩසටහන්වලින් බොහොමයක් අථත්‍ය (virtual) ආකාරයෙන් පවත්වන ලදී. කිලිනොච්චි, මඩකලපුව, අම්පාර, කුරුණෑගල සහ මාතර යන නියමු වැඩසටහන සඳහා තෝරා ගත් දිස්ත්‍රික්කවලින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක වෙසෙන පීඩාවට පත් පවුල් 136 ක් තෝරා ගෙන ඔවුන් සමඟ ක්ෂේත්‍ර මට්ටමින් අදාල කටයුතුවල නියැලෙමින් මෙම නියමු වැඩසටහන සමාලෝචිත වර්ෂය තුළ දී ආරම්භ කරන ලදී. මෙම ක්ෂේත්‍ර රාජකාරි කටයුතු 2022 මාර්තු මස වන විට අවසන් වීමට නියමිත අතර, 2022 වසරේ ජුනි මස දක්වා ආසන්න වශයෙන් මාස 06 ක කාලයක් පමණ ඉහත කී සිද්ධි කලමනාකරුවන් මෙම ක්‍රියාවලියෙහි නියැලෙනු ඇත.

3.5 සමඟිය, සංහිඳියාව හා ප්‍රචණ්ඩත්වය නැවත ඇති නොවීම සඳහා පියවර

මේ යටතේ ක්‍රියාවට නැංවිය යුතු වැඩසටහන් කිහිපයක් දැනටමත් හඳුනා ගෙන, ඒ පිළිබඳ සාකච්ඡා කරමින් පවතින අතර යථා කාලයේ දී ඒවා ක්‍රියාවට නැංවීම සඳහා අදාල රජයේ සහ සිවිල් සමාජ සංවිධාන ඇතුළු අදාල පාර්ශ්වකරුවන් සමඟ එක්ව කටයුතු කරනු ඇත. ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන් අතර සමගිය සහ ඒකීයබව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රූප කතා පොතක් හඳුන්වා දීමේ අරමුණින් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ මූලික සාකච්ඡාවන් පවත්වන ලදී.

අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ (OMP), ජාතික සමඟිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලයේ (ONUR) සහ හානිපූරණ කාර්යාලයේ අරමුණුවල ඇති පොදුබව සැලකිල්ලට ගනිමින්, ඒ මත පදනම්ව හානිපූරණ කාර්යාලයේ සාමාජිකයන් විසින් "සාමූහික සංසදය" (Unity Cluster) නම් ඒකාබද්ධ උපදේශන කණ්ඩායමක් ආරම්භ කර ඇත. මෙම කණ්ඩායම නිරන්තරයෙන් රැස් වී ආයතන ත්‍රිත්වයම සඳහා පොදු වැඩසටහන් සහ සහාය ක්ෂේත්‍රයන් පිළිබඳ සාකච්ඡා කරන අතර, ඒ තුළින් වැඩසටහන් ද්විත්වකරණයවීම වළක්වා සම්පත් වඩාත් අර්ථවත් අයුරින් භාවිතයට ගැනීම ප්‍රවර්ධන කරනු ලබයි.

3.6 අනෙකුත් ප්‍රධාන වැඩසටහන්

- **පාර්ශ්වකරුවන් අතර දැනුවත්බව ඇති කිරීම**

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද හානිපූරණ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශයන් සහ හානිපූරණයන් ප්‍රදානය කිරීමේ දී හානිපූරණ කාර්යාලයේ කාර්යභාරය පිළිබඳව විවිධ පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම සඳහා හානිපූරණ කාර්යාලය විසින් ඉදිරිපත් කිරීම් කරන ලදී. එම ඉදිරිපත් කිරීම්වල සාරාංශය පහත පරිදි වේ -

- **සංවර්ධන කොටස්කරුවන් -** 2021 **ඔක්තෝබර්** 08
- බටර්ෆ්ලයි පීස් ගාර්ඩන් සිවිල් සමාජ සංවිධානය - 2021 ඔක්තෝබර් 27
- ගරු ආණ්ඩුකාරතුමා සහ උතුරු පළාතේ දිස්ත්‍රික් ලේකම්වරුන් අතර හමුව - 2021 ඔක්තෝබර් 29
- **සිවිල් සමාජ එකතුව -** 2021 **නොවැම්බර්** 09
- මුස්ලිම් කාන්තා සංවර්ධන භාරය (පුත්තලම දිස්ත්‍රික්කයේ අවතැන් වූ ප්‍රජාව) - 2021 නොවැම්බර් 25
- මඩකලපුව දිස්ත්‍රික්කයේ ආබාධිත ක්‍රියාකාරී කමිටුව - 2021 දෙසැම්බර් 21

- **සිවිල් සමාජ සංවිධාන සමඟ කටයුතු කිරීම:**

ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සකස් කිරීමට ප්‍රථම හානිපූරණ කාර්යාලය විසින් සිවිල් සමාජ සංවිධාන හමු වී ඔවුන්ගේ ප්‍රතිපෝෂණ ලබා ගන්නා ලදී. මෙම කාර්යාලය විසින් ක්ෂේත්‍ර මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී සහ විශේෂයෙන්ම එක්ව කටයුතු කිරීම තුළින් සම්පත් ප්‍රමාණය වර්ධනය කර ගැනීම සඳහා මෙකී සංවිධානවල සහාය සුරක්ෂිත කර ගැනීමට ඇති වැදගත්කම හානිපූරණ කාර්යාලය විසින් සැලකිල්ලට බඳුන් කරන ලදී. මෙම කරුණු සැලකිල්ලට ගනිමින්, හානිපූරණ කාර්යාලය විසින් 2021 ඔක්තෝබර් 15 දිනැතිව සිවිල් සමාජ සංවිධාන සමඟ සංවාදයක් සිදු කළ අතර, මේ සඳහා සංවිධාන 30ක් නියෝජනය කරමින් 40 දෙනෙකු පමණ සහභාගී විය. මෙම සාකච්ඡාවේ ඉදිරි පියවරක් ලෙස හානිපූරණ කාර්යාලය විසින් පීඩාවට පත් ප්‍රජාවන්ගේ සුභසිද්ධිය උදෙසා වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා සිවිල් සමාජ සංවිධාන කිහිපයක් සමඟ ද්විපාර්ශ්වීය සාකච්ඡා පවත්වන ලදී.

- **නව හානිපූරණ රෙජීමය පිළිබඳ ප්‍රශ්න හා පිළිතුරු පොත් පිංච (Q&A Booklet) ප්‍රකාශයට පත් කිරීම**

පීඩාවට පත් තැනැත්තන් සමඟ සමීපව කටයුතු කරන තැනැත්තන්හට සහ ශ්‍රී ලංකාවේ හානිපූරණ රෙජීමය පිළිබඳ තොරතුරු දැන ගැනීමට බලාපොරොත්තු වන තැනැත්තන්හට අවශ්‍ය තොරතුරු ලබා අරමුණින් හානිපූරණ කාර්යාලය විසින් 2021 මාර්තු මස ප්‍රශ්න හා පිළිතුරු පොත් පිංචක් මුද්‍රණය කර බෙදා හරින ලදී. හානිපූරණ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශයන්ට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වීමට සමගාමීව, අනුමත කරන ලද යම් යම් ප්‍රතිපත්තිවල ඉදිරිදර්ශන ඇතුළත් කරමින් ප්‍රශ්න හා පිළිතුරු පොත් පිංච නැවත මුද්‍රණය කිරීමේ වැදගත්කමක් මතු විය. ඒ අනුව, 2022 දෙසැම්බර් මස දී ප්‍රශ්න හා පිළිතුරු පොත් පිංචෙහි නව මුද්‍රණයක් ප්‍රකාශයට පත් කරන ලදී.

- **තොරතුරුවල විනිවිදභාවය සහ බෙදා හැරීම**

මහජනයා වෙත යෝග්‍ය හා නිවැරදි තොරතුරු ලබා දීමේ අරමුණෙන් හානිපූරණ කාර්යාලයේ වෙබ්අඩවිය ප්‍රතිසංස්කරණය කර, භාෂා ත්‍රිත්වයෙන්ම සියළු තොරතුරු ඇතුළත් කරන ලදී. පීඩාවට පත් තැනැත්තන්ගේ තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා වන අයුරින් වෙබ් අඩවිය තුළ තොරතුරු කලමනාකරණය කර ඇත.

ඊට අමතරව, පීඩාවට පත් තැනැත්තන්හට හානිපූරණයන් ප්‍රදානය කිරීමේ දී සාක්ෂි මත පදනම්ව තීරණ ගැනීමට හැකි අයුරින් හානිපූරණ කාර්යාලයේ තොරතුරු කලමනාකරණ පද්ධතිය ද වැඩි දියුණු කරන ලදී.

- **හානිපූරණ සඳහා වන කාර්යාලයේ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම:**

ගැටුම්වලින් පීඩාවට පත් තැනැත්තන් සමඟ කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු වින්දිත කේන්ද්‍රීය ප්‍රවේශය පිළිබඳව හානිපූරණ කාර්යාලයේ කාර්යමණ්ඩලය දැනුවත් කිරීමේ සහ බලමුළු ගැන්වීමේ වැදගත්කම හානිපූරණ කාර්යාලය විසින් සැලකිල්ලට ගන්නා ලදී. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ දී හානිපූරණ කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා පහත වැඩමුළු පවත්වන ලදී -

- සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය විසින් පවත්වන ලද ස්ත්‍රී පුරුෂභාවය සහ හානිපූරණය පිළිබඳ සැසිය.
- කාන්තා පිහිට ආයතනය විසින් පවත්වන ලද ගෘහස්ථ හිංසනය පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය.
- 2021 වසරේ ලෝක මානසික සෞඛ්‍ය දිනය සැමරීම නිමිත්තෙන් පීඩාවට පත් තැනැත්තන්ගේ මානසික තත්ත්වයන් සහ සහන ලබා දීමේ දී හානිපූරණ කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ කාර්යභාරය පිළිබඳව හානිපූරණ කාර්යාලයේ මනෝසාමාජීය සහාය උපදේෂක විසින් පවත්වන ලද සැසිය.
- හානිපූරණ කාර්යාලය විසින් පුහුණු කරන ලද සිද්ධි කලමනාකරුවන් විසින් ඔවුන්ගේ සැබෑ අත්දැකීම් මත පදනම්ව ආතතිය සහ එය කලමනාකරණය කිරීම පිළිබඳ පවත්වන ලද සැසිය.
- සේවාවන් ලබා දීමේ දී පොදු සහ ප්‍රතිඵල කේන්ද්‍රීය ප්‍රවේශයක් යොදා ගැනීම මූලික අරමුණ කර ගනිමින් අධ්‍යක්ෂ ජනරාල්තුමිය විසින් හානිපූරණ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශයන් පිළිබඳ පවත්වන ලද දැනුවත් කිරීමේ සැසිය.
- පීඩාවට පත් තැනැත්තන්ගේ අවශ්‍යතා තේරුම් ගැනීම පිළිබඳව පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්වරයා විසින් 2022.01.24 දිනැතිව පවත්වන ලද දැනුවත් කිරීමේ සැසිය.

4. ලේකම් කාර්යාලය

හානිපූරණ කාර්යාලයේ ලේකම් කාර්යාලයේ සේවක සංඛ්‍යාව පහත පරිදි වේ:

තනතුර	අනුමත කර ඇති තනතුරු සංඛ්‍යාව	පුරප්පාඩු
සභාපති	01	-
අධ්‍යක්ෂ ජනරාල්	01	-
අධ්‍යක්ෂ	01	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ	04	01
පරිපාලන නිලධාරි	01	-
අභ්‍යන්තර විගණක	01	-
හානිපූරණ නිලධාරී	22	09
භාෂා පරිවර්තක	01	-
අභ්‍යන්තර විසඳුම් සහායක	01	01
කලමනාකරණ සහකාර	30	09
රියදුරු	07	02
කාර්යාල සහායක	07	-
ආරක්ෂක නියාමක	01	-
එකතුව	**78**	**23**

ඉහත තනතුරුවලට අමතරව, පහත ක්ෂේත්‍රයන්ට අදාලව සේවාවන් ලබා ගැනීම සඳහා සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) මඟින් පූර්ණ කාලීන උපදේශකවරුන්ගේ සහාය මෙම කාර්යාලය වෙත ලබා දී ඇත-

1. උපදේශක - පර්යේෂණ සහ වැඩසටහන්
2. උපදේශක - මනෝසාමාජීය සහාය
3. උපදේශක - වැඩසටහන්

හානිපූරණ කාර්යාලයේ දැනට පවතින සැලකිය යුතු අභියෝගයක් වී ඇති වන්දි ලිපිගොනු කටයුතුවලට අදාලව රාජකාරි කරන කාර්ය මණ්ඩලයේ ඇති පුරප්පාඩු (41%ක් හානිපූරණ නිලධාරීන් සහ 30%ක් කලමනාකරණ සහකාර නිලධාරීන්) පිරවීමට කටයුතු කරනු ඇත.

5. මූල්‍ය ප්‍රගතියේ සාරාංශය

2021 වසර සඳහා අයවැය වෙන් කිරීම වශයෙන් රුපියල් මිලියන 910 ක මුදලක් හානිපූරණ කාර්යාලය වෙත ලැබුණු නමුත් පැවැති කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ රජය විසින් දිගින් දිගටම සිදු කරනු ලැබූ රට අගුළු දැමීම් හේතුවෙන් අපේක්ෂිත වියදම් ප්‍රමාණය සිදු කිරීමට නොහැකි විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස සහ රේඛීය අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කළ පරිදි පුනරාවර්ත අයවැයෙන් රු. මිලියන 400 ක් සහ ප්‍රාග්ධන අයවැයෙන් රු. මිලියන 03 ක මුදලක් ඉතිරි කිරීම් ලෙස හඳුනා ගෙන ඇත.

සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රගතියේ සාරාංශය පහත පරිදි වේ:

අයිතමය	වෙන් කිරීම (රු. මිලියන)	ලැබුණු අක්මුදල් ප්‍රමාණය (රු. මිලියන)	වියදම (රු. මිලියන)	ලැබූ අක්මුදල්වල වියදම ප්‍රතිශතයක් ලෙස	සටහන්
පුනරාවර්ත					
වැටුප් සහ වේතන	42.00	40.50	40.50	100%	අමතර රු. මිලියන 4.12 ක වියදමක් ජනනය කරන ලද ලදුපත්වලින් පියවා ගන්නා ලදී
වෙනත් පුනරාවර්තන	58.00	29.00	29.00	100%	අමතර රු. මිලියන 14.04ක වියදමක් ජනනය කරන ලද ලදුපත්වලින් පියවා ගන්නා ලදී
වන්දි ගෙවීම්	800.00	399.83	399.83	100%	
එකතුව	**900.00**	**469.83**	**469.33**	**100%**	
ප්‍රාග්ධන					
ප්‍රාග්ධන	10.00	7.00	2.41	0.17%	ප්‍රසම්පාදන සඳහා ප්‍රතිචාර ලැබීම ප්‍රමාදවීම හේතුවෙන් භාවිතය අඩු විය.
මුළු එකතුව	**910.00**	**476.83**	**471.44**	**99%**	

6. කෘතඥතාවය

හානිපූරණ කාර්යාලයේ ප්‍රධාන වැඩසටහන් බොහෝ ගණනක් ක්‍රියාවට නැංවීමේ දී සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) විසින් ලබා දුන් සහයෝගය පිළිබඳ හානිපූරණ කාර්යාලයේ හෘදයාංගම ස්තූතිය පළ කර සිටිමු. තවද, මෙම කාර්යාලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා ඔවුන් විසින් මහඟු දායකත්වයක් ලබා දුන් බව සඳහන් කළ යුතු ය.

නසීමා අහමඩ්
අධ්‍යක්ෂ ජනරාල්
හානිපූරණය සඳහා වන කාර්යාලය,
ශ්‍රී ලංකාව.

හානිපූරණය සඳහා වන කාර්යාලය
අංක 408, ගාලු පාර,
කොළඹ - 03.

හානිපූරණය සඳහා වන කාර්යාලයය
2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන්	2021 රු.	2020 රු.
වත්කම්		**නැවත ප්‍රකාශ කරන ලද**	
ජංගම වත්කම්			
තොගය - ලිපි දව්‍ය	1	845,419	672,691
අයවිය යුතු ණය	2	4,375,312	4,375,312
සේවක ණය - කෙටි කාලීන	3	2,059,244	1,934,233
සේවක පාරිතෝෂික ආයෝජන	4	20,136,386	22,872,689
අත්තිකාරම්, ගෙවීම් සහ වෙනත් ලැබීම්	5	31,359,954	28,274,415
මුදල් සහ මුදල් හා සමාන දෑ	6	22,408,301	31,087,652
		81,184,617	**89,216,992**
ජංගම නොවන වත්කම්			
සේවක ණය	7	9,397,771	9,905,891
දේපළ, පිරියත හා උපකරණ	8	6,264,289	5,516,412
දිගු කාලීන ආයෝජන	9	504,910,713	745,410,713
අස්පෘශ්‍ය වත්කම්	10	2,245,500	2,664,000
		522,818,273	**763,497,016**
මුළු වත්කම්		**604,002,890**	**852,714,008**
බැරකම්			
ජංගම බැරකම්			
වෙනත් ගෙවිය යුතු දෑ	11	12,538,827	6,145,248
		12,538,827	**6,145,248**
ජංගම නොවන බැරකම්			
වෙන් කිරීම් සහ වෙනත් බැරකම්	12	363,419,692	603,919,692
විශ්‍රාම වරප්‍රසාද වගකීම	13	14,060,457	16,199,662
		377,480,149	**620,119,354**
මුළු බැරකම්		**390,018,977**	**626,264,602**
ශුද්ධ වත්කම්		**213,983,914**	**226,449,406**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
රාජ්‍ය ප්‍රදාන හා ප්‍රත්‍යගණන අතිරික්තය		**7,723,578**	**2,650,032**
සමුච්චිත අරමුදල		**206,260,336**	**223,799,374**
මුළු ශුද්ධ වත්කම් / බැරකම්		**213,983,914**	**226,449,406**

සහතික කිරීම.

2021 දෙසැම්බර් 31 දිනට ඉහත මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දෙන බවත්,
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එහි ශුද්ධ අතිරික්තය/ඌනතාවය අප විසින් සහතික කරමු.

.....
එස්.එන්.ඩී.ඩබ්ලිව්.එම්.ධර්මකීර්ති
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)

.....
ඒ.එල්.එස්. නසීමා
අධ්‍යක්ෂ ජනරාල්

මෙකී මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම හානිපූරණය සඳහා වන කාර්යාලයය සාමාජික මණ්ඩලය සතු වගකීම කි. හානිපූරණය සඳහා වන කාර්යායාලයයේ සාමාජික මණ්ඩලය සහ ඔවුන් වෙනුවෙන් අත්සන් තබා මෙකී මූල්‍ය ප්‍රකාශන අනුමත කරමි.

.....
ධාරා විජේතිලක
සභාපතිනි

.....
ආචාර්යය ඒ. එම්. ස්වාමිනාතන්
සාමාජික

හානිපූරණය සඳහා වන කාර්යාලයය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය

	සටහන්	2021 රු.	2020 රු.
			* නැවත ප්‍රකාශ කරන ලද
අයභාර			
පුනරාවර්තන ප්‍රදාන	I	459,332,000	397,063,000
පොළී	II	9,117,252	14,504,036
වෙනත් අයභාර		1,400	432
විලම්භිත ආදායම		1,926,454	2,398,642
මුළු අයභාර		**470,377,106**	**413,966,110**
වියදම්			
වැටුප්,වේතන සහ සේවක වරප්‍රසාද	III	44,621,412	51,547,976
ප්‍රතිපත්ති අරමුණු ක්‍රියාත්මක කිරීම	IV	399,832,058	296,751,076
වන්දි ගෙවීම සඳහා වූ වෙනත් වියදම්	V	789,678	-
සැපයුම් සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය	VI	2,595,965	1,747,049
ක්ෂයවීම්	VII	1,926,454	2,398,642
ක්‍රමක්ෂය	VIII	418,500	351,000
ස්ථාවර වත්කම් නඩත්තුව	IX	4,197,975	3,002,605
වෙනත් වියදම්	X	33,109,574	41,573,814
මුළු වියදම්		**487,491,617**	**397,372,162**
කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/ඌනතාවය		**(17,114,511)**	**16,593,948**

හානිපූරණය සඳහා වන කාර්යාලයය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

විස්තරය	සටහන්	2021	2020
		(රු.)	(රු.)
මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහයන්			
මහා භාණ්ඩාගාරයෙන් ලද අක්මුදල්		459,332,000	397,063,000
විවිධ ආදායම් හා වෙනත් ලැබීම්		1,400	432
අපහරණය කරන ලද වත්කම් ආදායම		-	4,340
වෙනත් පුනරාවර්තන වියදම්	ඒ	(483,791,133)	(400,341,449)
මෙහෙයුම් කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහ		**(24,457,732)**	**(3,273,678)**
ආයෝජන කාර්යයන්ගේ මුදල් ප්‍රවාහ			
පොළී ආදායම	බී	1,795,662	20,563,000
ණය අයකර ගැනීම් සහ වෙනත්	සී	14,298,359	9,707,238
ස්ථාවර වත්කම් මිලදී ගැනුම්	ඩී	(2,413,108)	(2,398,300)
කල් පිරුණු ආයෝජන ආපසු ලැබීම්	ඊ	240,500,000	128,000,000
ආයෝජන හා වෙනත්	එෆ්	(245,402,530)	(177,587,831)
ආයෝජන කාර්යයන්ගේ මුදල් ප්‍රවාහ		**8,778,382**	**(21,715,894)**
මූල්‍යමය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහය		**7,000,000**	**2,410,000**
මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන		7,000,000	2,410,000
මුදල් සහ මුදල් සමාන දෑ - ශුද්ධ වැඩිවීම/අඩුවීම		**(8,679,350)**	**(22,579,572)**
කාල පරිච්ඡේදය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ	ජී	**31,087,651**	**53,667,223**
කාල පරිච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ	එච්	**22,408,301**	**31,087,651**

* ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය වාර්තාවල අවශ්‍ය අංගයක් වේ.

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
සඳහා සටහන්

2020 (රු.)	සටහන්	වත්කම්	2021 (රු.)
672,691.31	1	**තොගය**	**845,419.40**
621,031.31		තොග (ලිපි ද්‍රව්‍ය) - උපලේඛන iii	837,119.40
51,660.00		තොග (සුභ සාධක) - උපලේඛන iii	8,300.00
4,375,312.36	2	**අයවිය යුතු ණය**	**4,375,312.36**
4,375,312.36		රු.200,000.00 ලංකා බැංකු ව්‍යාපාරික ණය	4,375,312.36
4,375,312.36			
		අඩු කළා : වෙන් කිරීම්	
		අඩමාන ණය සඳහා වෙන් කිරීම්	
(4,375,312.36)		රු.200,000.00 ලංකා බැංකු ව්‍යාපාරික ණය	(4,375,312.36)
		2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	-
1,934,233.40	3	**සේවක ණය - කෙටි කාලීන**	**2,059,243.72**
288,585.16		දේපළ ණය - උපලේඛන ii	214,922.40
1,627,248.24		ආපදා ණය - උපලේඛන ii	1,814,321.32
18,400.00		විශේෂ අත්තිකාරම් - උපලේඛන ii	-
-		උත්සව අත්තිකාරම් - උපලේඛන ii	30,000.00
22,872,688.94	4	**සේවක පාරිතෝෂික ආයෝජන**	**20,136,385.97**
22,872,688.94		සේවක පාරිතෝෂික ආයෝජන	20,136,385.97
28,274,415.33	5	**අත්තිකාරම්,ගෙවීම් සහ වෙනත් ලැබීම්**	**31,359,954.37**
350,000.00		ණයදෙන ආයතනවලින් ලැබිය යුතු සේවා ගාස්තු	6,329,039.31
750,242.51		පාරිතෝෂික ආයෝජන ලැබිය යුතු පොළී	519,644.63
647,007.33		අයවිය යුතු ලැබීම් - උපලේඛන vii	665,258.97
207,920.85		පෙර - ගෙවුම් - උපලේඛන iv	104,194.21
3,545,007.26		උපචිත ලැබීම් - උපලේඛන ix	1,358,694.87
22,774,237.38		ආපසු අයකර ගත හැකි තැන්පතු උපලේඛන v	22,383,122.38

31,087,651.43	**6**	**මුදල් හා මුදල් සමාන දෑ**	**22,408,301.48**
		උපලේඛන vi	
		ලංකා බැංකුව තැප්‍රොබේන් ශාඛාව	
(217,029,004.79)		ගිණුම් අංක- 2026495	22,093,017.44
		ලංකා බැංකුව තැප්‍රොබේන් ශාඛාව	
315,284.04		ගිණුම් අංක- 2026496	315,284.04
		ලංකා බැංකුව මෙට්‍රොපොලිටන් ශාඛාව	
247,801,372.18		ගිණුම් අංක - 74757297	-
9,905,889.87	**7**	**සේවක ණය**	**9,397,770.90**
2,581,252.58		දේපළ ණය - උපලේඛන ii	2,270,238.15
7,311,837.29		ආපදා ණය - උපලේඛන ii	7,114,732.75
2,800.00		විශේෂ අත්තිකාරම් - උපලේඛන ii	2,800.00
10,000.00		උත්සව අත්තිකාරම් - උපලේඛන ii	10,000.00
5,516,412.40	**8**	**දේපළ, පිරියත හා උපකරණ පිරිවැය**	**6,264,289.31**
43,894,055.98		වර්ෂයේ ආරම්භක දිනට අගය	45,617,355.98
1,723,300.00		වර්ෂය තුළ එකතු කිරීම්	2,413,108.46
-		**ජ'නර්ල් සටහන් අංක . 22**	
-		කාර්යාලය ගොඩනැගිල්ල - කාමර බෙදා වෙන් කිරීම සඳහා රඳවා ගැනීම - 5%	261,222.84
45,617,355.98			**48,291,687.28**
		ක්ෂයවීම්	
37,702,301.21		වර්ෂයේ ආරම්භක දිනට අගය	40,100,943.58
2,398,642.37		**එකතු කළා** - වර්ෂය සඳහා ක්ෂයවීම්	1,926,454.39
40,100,943.58		වර්ෂයේ අවසාන දිනට අගය	**42,027,397.97**
5,516,412.40		වර්ෂයේ අවසාන දිනට අගය	**6,264,289.31**
		(විස්තර සඳහා සටහන් අංක 12 - 1 බලන්න)	
745,410,712.63	**9**	**දිගුකාලීන ආයෝජන**	**504,910,712.63**
745,410,712.63		ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ණයදෙන ආයතනවලට ලබා දුන් අරමුදල්	504,910,712.63
		(විස්තර සඳහා සටහන් අංක 13 - 1 බලන්න)	

2,664,000.00	**10**	**අස්පෘශ්‍ය වත්කම් පිරිවැය**	**2,245,500.00**
2,340,000.00		වර්ෂයේ ආරම්භක දිනට අගය	2,664,000.00
675,000.00		**වර්ෂය තුළ එකතු කිරීම් ක්‍රමක්ෂය**	-
-		වර්ෂයේ ආරම්භක දිනට අගය	-
351,000.00		**එකතු කළා- වර්ෂය සඳහා ක්‍රමක්ෂය**	418,500.00
351,000.00		වර්ෂයේ අවසාන දිනට අගය	**418,500.00**
		ඉදිරියට ගෙන ආ අගය	
2,664,000.00		වර්ෂයේ අවසාන දිනට අගය	2,245,500.00
		(විස්තර සඳහා සටහන් අංක 12 - 1 බලන්න	
852,714,007.67		**මුළු වත්කම්**	**604,002,890.14**
6,145,247.73	**11**	**වෙනත් ගෙවිය යුතු දෑ**	**12,538,827.21**
3,684,489.73		උපචිත වියදම් - උපලේඛන viii	4,513,577.41
1,860,758.00		හිමිකම් නොපාන ලද වන්දි - උපලේඛන x	6,564,026.96
-		තැන්පතු ගිණුම	261,222.84
600,000.00		විගණන ගාස්තු සඳහා වෙන් කිරීම්	1,200,000.00
603,919,692.36	**12**	**වෙන් කිරීම් සහ වෙනත් බැරකම්**	**363,419,692.36**
599,544,380.00		ඒකාබද්ධ සහනාධාර ක්‍රමය යටතේ ණය දීම සඳහා භාණ්ඩාගාරය විසින් සපයනු ලැබූ අරමුදල්	359,044,380.00
4,375,312.36		අඩමාන ණය සඳහා වෙන් කිරීම් රු.200,000.00 ලංකා බැංකු ව්‍යාපාරික ණය	4,375,312.36
16,199,662.00	**13**	**විශ්‍රාම වරප්‍රසාද වගකීම**	**14,060,457.00**
16,199,662.00		විශ්‍රාම වරප්‍රසාද වගකීම (උපලේඛන - xi)	14,060,457.00
626,264,602.09		**මුළු බැරකම්**	**390,018,976.57**
226,449,405.58		**ශුද්ධ වත්කම්**	**213,983,913.57**

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සඳහා සටහන්

2020 (රු.)	සටහන්		2021 (රු.)
		අයභාර	
397,063,000.00	**1**	**අනෙකුත් රාජ්‍ය අස්තිත්වයන්ගෙන් සංක්‍රාම ගෙවීම්**	**459,332,000.00**
285,063,000.00		භාණ්ඩාගාර අක්මුදල් - වන්දි	399,832,000.00
62,000,000.00		භාණ්ඩාගාර අක්මුදල් - වැටුප්	30,500,000.00
50,000,000.00		භාණ්ඩාගාර අක්මුදල් - වෙනත් පුනරාවර්තන	29,000,000.00
14,504,036.34	**II**	**පොළී**	**9,117,251.61**
		ණයදෙන ආයතනවල ආයෝජනවලින් ලද සේවා ගාස්තු	
687,909.83		ලංකා බැංකුව	400,000.00
150,000.00		මහජන බැංකුව	150,000.00
200,000.00		රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	200,000.00
5,887,347.67		ලංකා බැංකුව - ස්වයං රැකියා - නව	4,501,348.49
1,500,593.06		ලංකා බැංකුව - නිවාස - නව	1,077,690.82
2,222,993.92		පාරිතෝෂික ආයෝජන - නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව	1,395,916.81
3,446,730.39		ඉතුරුම් ගිණුම සඳහා පොළී - ලංකා බැංකුව	928,960.07
		සේවක ණය සඳහා පොළී	
114,871.16		දේපළ ණය	102,666.01
290,184.56		ආපදා ණය	356,456.25
3,405.75		විශේෂ අත්තිකාරම්	4,213.16
431.67		**වෙනත් අයභාර**	**1,400.26**
431.67		වෙනත් අයභාර	1,400.26
411,567,468.01		**මුළු අයභාර**	**468,450,651.87**

වියදම්

51,547,975.95	**III**	**වැටුප් හා වේතන**	**44,621,412.13**
24,320,713.44		කාර්යය මණ්ඩල වැටුප්	23,847,391.95
3,624,038.48		සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල්	3,495,412.49
906,010.06		සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල්	873,853.14
4,987,623.33		ජීවන වියදම් දීමනාව	4,933,196.66
196,243.53		භාෂා දීමනාව	207,731.17
959,058.34		වෙනත් දීමනා	948,691.68
-		අන්තර් දීමනාව	12,500.00
-		වැන්දඹු හා අනත්දරු විශ්‍රාම දායකත්වය	119,631.25
19,500.00		දිරි දීමනාව	18,000.00
368,500.00		වෘත්තීය දීමනාව	283,000.00
442,083.79		අතිකාල සහ නිවාඩු දින වැටුප්	1,405,676.46
1,620,000.00		සභාපතිනී දීමනාව	1,620,000.00
3,240,000.00		සාමාජික දීමනාව	3,870,000.00
66,000.00		විගණන කමිටු සාමාජික දීමනාව	102,000.00
638,333.33		වාහන කුලිය	923,333.33
593,506.65		ඉන්ධන දීමනාව	799,614.00
1,200,000.00		ගමන් වියදම් දීමනාව	925,000.00
408,000.00		දුරකථන දීමනාව	489,000.00
4,989,059.50		ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමය	-
2,969,305.50		පාරිතෝෂික දීමනාව	(252,620.00)
296,381,049.00	**IV**	**ප්‍රතිපත්ති අරමුණු ක්‍රියාත්මක කිරීම**	**399,832,058.00**
		මරණ හා තුවාල වන්දි	
230,000.00		රජයේ නිලධාරීන්	425,000.00
46,057,500.00		සාමාන්‍ය මහජන	40,705,000.00
7,275,000.00		පාස්කු ප්‍රහාරය 2019 අප්‍රේල් 21	300,000.00
214,310.00		දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියා - මරණ හා තුවාල	-
		හානියට පත් දේපළ සඳහා වන්දි	
11,980,950.00		රජයේ නිලධාරීන්	18,821,500.00
92,850,824.00		සාමාන්‍ය මහජන	302,385,296.00
27,119,520.00		පූජනීය ස්ථාන	30,124,137.00

ප්‍රතිපත්ති අරමුණු ක්‍රියාත්මක කිරීම
හානියට පත් දේපළ සඳහා වන්දි

28,336,000.00		මහනුවර සිදුවීම 2018 16/2018	1,802,150.00
77,012,627.00		පාස්කු ප්‍රහාරයට පසු සිදුවීම 2019	268,975.00
4,894,818.00		පාස්කු ප්‍රහාරය 2019 අප්‍රේල් 21 (කොච්චිකඩේ)	-
409,500.00		දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියා - දේපළ	
		පාස්කු ප්‍රහාරය 2019 අප්‍රේල් 21 (දෙහිවල)	5,000,000.00
370,026.50	**V**	**වන්දි ගෙවීම සඳහා වූ වෙනත් වියදම්**	**789,678.47**
296,236.50		ස්වයං රැකියාලාභී පුහුණු වැඩසටහන	149,321.00
73,790.00		වන්දි ප්‍රදානය කිරීමේ උත්සව කටයුතු සහ ජංගම සේවා	640,357.47
1,747,048.81	**VI**	**සැපයුම් හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය**	**2,595,964.91**
957,718.81		ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	1,407,282.91
648,000.00		ඉන්ධන හා ලිහිසි තෙල්	1,049,092.00
57,000.00		නිල ඇඳුම්	57,000.00
84,330.00		පුවත්පත් සහ සඟරා	82,590.00
2,398,642.37	**VII**	**ක්ෂයවීම්**	**1,926,454.39**
699,854.68		ක්ෂය - ලී බඩු, කාර්යාල උපකරණ හා සවි කිරීම්	700,546.38
598,082.19		ක්ෂය -කාර්යාලය ගොඩනැගිල්ල - කාමර බෙදා වෙන් කිරීම	876,917.81
46,888.39		ක්ෂය - දුරකථන	61,310.20
84,477.13		ක්ෂය - යන්ත්‍ර හා පිරියත	107,929.08
969,339.98		ක්ෂය - පරිගණක	179,750.92
351,000.00	**VIII**	**ක්‍රමක්ෂය**	**418,500.00**
351,000.00		පරිගණක දත්ත පද්ධතිය	418,500.00

3,002,604.90	**IX**	**ස්ථාවර වත්කම් නඩත්තුව**	**4,197,975.49**
480,502.25		ස්ථාවර වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව	406,992.50
1,049,519.47		වාහන අලුත්වැඩියාව හා නඩත්තුව	1,604,804.77
1,472,583.18		ගොඩනැගිල්ල නඩත්තු වියදම්	2,186,178.22
41,573,814.32	**X**	**වෙනත් වියදම්**	**33,109,573.58**
19,600.00		ගමන් වියදම් - දේශීය	122,067.50
462,603.98		දුරකථන ගාස්තු	472,690.08
150,000.00		තැපැල් ගාස්තු	273,090.00
2,524,748.46		විදුලිය බලය සහ අනෙකුත් පහසුකම්	2,228,298.10
32,667,550.03		ගොඩනැගිලි කුලිය	22,408,466.96
434,877.00		විගණන ගාස්තු	600,000.00
214,000.00		සම්මන්ත්‍රණ, වැඩමුළු හා බඳවා ගැනීම්	166,114.16
156,077.00		විවිධ වියදම්	379,039.00
796,207.96		සුභ සාධක වියදම්	1,307,002.50
2,592,000.00		මෙහෙයුම් කල්බදු වියදම	2,592,000.00
-		මුද්‍රණ හා ප්‍රචාරණ ගාස්තු	924,059.00
15,000.00		නීති ගාස්තු - නඩු අංක 5961	15,000.00
1,541,149.89		සේවකයන් සඳහා වෛද්‍ය රක්ෂණ	1,621,746.28
397,372,161.85		**මුළු වියදම**	**487,491,616.97**
14,195,306.16		**කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය /ඌනතාවය**	**(19,040,965.10)**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සටහන්

		2021 (රු.)
ඒ	**වෙනත් පුනරාවර්තන වියදම්**	**(483,971,132.51)**
	පෞද්ගලික පඩිනඩි	(46,777,697.98)
	ගමන් වියදම්	(77,850.00)
	සැපයුම්	(2,812,323.00)
	නඩත්තුව	(3,756,276.02)
	ගිවිසුම්ගත සේවා	(26,482,237.46)
	වෙනත් පුනරාවර්තන වියදම්	(3,426,163.58)
	මරණ / තුවාල වන්දි	(41,430,000.00)
	හානියට පත් දේපළ සඳහා වන්දි	(358,402,058.00)
	වන්දි සඳහා වෙනත් වියදම්	(806,526.47)
බී	**පොළී ආදායම**	**1,795,661.85**
	2020 වර්ෂය සඳහා ණයදෙන ආයතනවලින් ලද සේවා ගාස්තු	350,000.00
	පාරිතෝෂික ආයෝජන	53,366.36
	සේවක ණයවලින් ලද පොළී	
	ආපදා ණය	356,456.25
	දේපළ ණය	102,666.01
	විශේෂ අත්තිකාරම්	4,213.16
	ඉතුරුම් ගිණුමෙන් ලද පොළී	928,960.07
සී	**ණය අයකර ගැනීම් සහ වෙනත්**	**14,298,358.67**
	උත්සව අත්තිකාරම්	290,000.00
	ආපදා ණය	1,994,533.46
	දේපළ ණය	384,677.19
	විශේෂ අත්තිකාරම්	126,400.00
	හිමිකම් නොපාන ලද වන්දි	5,911,673.96
	විවිධ තැන්පතු	1,281,622.76
	පාරිතෝෂික ආයෝජන	4,309,451.30
ඩී	**ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම**	**(2,413,108.46)**
	ලී බඩු කාර්යාල උපකරණ හා සවි කිරීම්	(944,310.50)
	යන්ත්‍ර සහ පිරියත	(518,364.00)

කාර්යාලය ගොඩනැගිල්ල - කාමර බෙදා වෙන් කිරීම	(950,433.96)
ඊ කල් පිරුණු ආයෝජන ආපසු ලැබීම්	**240,500,000.00**
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	**12,000,000.00**
2021 පෙබරවාරි 09	1,000,000.00
2021 මාර්තු 29	1,000,000.00
2021 ජූනි 23	1,000,000.00
2021 ජූලි 07	2,000,000.00
2021 ජූලි 29	1,000,000.00
2021 අගෝස්තු 08	1,000,000.00
2021 ඔක්තෝම්බර් 04	1,000,000.00
2021 නොවැම්බර් 11	2,000,000.00
2021 දෙසැම්බර් 16	1,000,000.00
2021 දෙසැම්බර් 22	1,000,000.00
ලංකා බැංකුව	**228,500,000.00**
2021 මාර්තු 16 - ලංකා බැංකු ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය - 1%	32,500,000.00
2021 අගෝස්තු 13 - ලංකා බැංකු ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය - 1%	2,000,000.00
2021 අගෝස්තු 13 - ලංකා බැංකු ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය - 1%	5,000,000.00
2021 අගෝස්තු 13 - ලංකා බැංකු ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය - 1%	50,000,000.00
2021 අගෝස්තු 13 - ලංකා බැංකු ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය - 1%	50,000,000.00
2021 අගෝස්තු 13 - ලංකා බැංකු ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය - 1%	50,000,000.00
2021 දෙසැම්බර් 28 - ලංකා බැංකු නවාස ණය යෝජනා ක්‍රමය - 1%	9,000,000.00
2021 දෙසැම්බර් 28 - ලංකා බැංකු ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය - 1%	30,000,000.00
එෆ් ආයෝජන හා වෙනත්	**(245,402,529.76)**
කල් පිරුණු ආයෝජන මහා භාණ්ඩාරය වෙත ආපසු යැවීම	**(240,500,000.00)**
2021 මාර්තු 19 - ලංකා බැංකුව	(32,500,000.00)
2021 අගෝස්තු 30 - ලංකා බැංකුව	(157,000,000.00)
2021 අගෝස්තු 30 - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	(7,000,000.00)
2021 නොවැම්බර් 22 - ජාතික නිවාස සංවර්ධන අධිකාරි	(3,000,000.00)
2021 දෙසැම්බර් 23 - ජාතික නිවාස සංවර්ධන අධිකාරි	(1,000,000.00)

2021 දෙසැම්බර් 24 - ජාතික නිවාස සංවර්ධන අධිකාරි	(1,000,000.00)
2021 දෙසැම්බර් 30 - ලංකා බැංකුව	(39,000,000.00)
එෆ් ආයෝජන හා වෙනත්	**(4,902,529.76)**
උත්සව අත්තිකාරම්	(320,000.00)
ආපදා ණය	(1,984,502.00)
විශේෂ අත්තිකාරම්	(108,000.00)
හිමිකම් නො පාන ලද වන්දි	(1,208,405.00)
විවිධ තැන්පතු	(1,281,622.76)
ජී කාල පරිච්ඡේදය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ	**31,087,651.43**
ලංකා බැංකුව - ජංගම ගිණුම් අංක 02026495	(217,029,004.79)
ලංකා බැංකුව - ජංගම ගිණුම් අංක 02026496	315,284.04
ලංකා බැංකුව - ඉතුරුම් ගිණුම් අංක 74757297	247,801,372.18
එච් කාල පරිච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ	**22,408,301.48**
ලංකා බැංකුව - ජංගම ගිණුම් අංක 02026495	22,093,017.44
ලංකා බැංකුව - ජංගම ගිණුම් අංක 02026496	315,284.04
	-

හානිපූරණය සඳහා වන කාර්යාලයය - ශුද්ධ වත්කම් /ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සමුච්චිත අරමුදල	රජයේ ප්‍රාග්ධන ප්‍රදාන හා සංචිතය ප්‍රත්‍යගණන	එකතුව
2021 ජනවාරි 01 දිනට ශේෂය	223,799,374	2,650,032	226,449,406
වර්ෂයට අදාළ ගැලපුම්	(391,115)	(1,926,454.00)	(1,535,339)
වර්ෂයට අදාළ සංචිත		7,000,000	7,000,000
වර්ෂයට අදාළ වියදම්	(33,412)		(33,412)
කාලපරිච්ඡේදය සඳහා වූ අතිරික්තය /ඌනතාවය	(17,114,511)		(17,114,511)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	206,260,336	7,723,578	*213,983,914*

ජංගම නො වන වත්කම් 2021

මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය සඳහා සටහන් අංක 12-1

	රථ වාහන	ලී බඩු, කාර්යාල උපකරණ සහ සවි කිරීම්	යන්ත්‍ර හා පිරියත	දුරකථන	කාමර බෙදා වෙන් කිරීම	පරිගණක	පරිගණක දත්ත පද්ධතිය	එකතුව
පිරිවැය								
2021.01.01 දිනට ශේෂය	23,144,250.00	7,913,324.62	1,363,102.45	1,495,989.76	1,475,000.00	10,225,689.15	2,664,000.00	45,617,355.98
වර්ෂය තුළ එකතු කිරීම්		944,310.50	518,364.00		950,433.96			2,413,108.46
ජ'නර්ල් අංක 22					261,222.84			261,222.84
2021.12.31 දිනට ශේෂය	*23,144,250.00*	*8,857,635.12*	*1,881,466.45*	*1,495,989.76*	*2,686,656.80*	*10,225,689.15*	*2,664,000.00*	***48,291,687.28***
ක්ෂයවීම්								
2021.01.01 දිනට ශේෂය	23,144,250.00	4,396,683.38	1,283,780.25	874,749.49	598,082.19	9,803,398.27	-	40,100,943.58
වර්ෂය තුළ ක්ෂය කිරීම්	-	700,546.38	107,929.08	61,310.20	876,917.81	179,750.92	418,500.00	1,926,454.39
2021.12.31 දිනට ශේෂය	*23,144,250.00*	*5,097,229.76*	*1,391,709.33*	*936,059.69*	*1,475,000.00*	*9,983,149.19*	*418,500.00*	***42,027,397.97***
2021.12.31 දිනට ඉදිරියට ගෙන ආ අගය	-	***3,760,405.36***	***489,757.12***	***559,930.07***	***1,211,656.80***	***242,539.96***	***2,245,500.00***	***6,264,289.31***

2021 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ සහනාධාර ක්‍රමය යටතේ ණයදෙන ආයතනවලට ලබා දුන් අරමුදල්

මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය සඳහා සටහන් අංක 13-1

ආයතනය	ලෙජර් පිටු අංක	නිවාස ණය	කර්මාන්ත ණය	ස්වයං රැකියා ණය	නව නිවාස ණය	එකතුව
ලංකා බැංකුව	37,39 සහ 41	-	16,000,000.00	320,204,712.63	98,991,000.00	435,195,712.63
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	43	10,000,000.00	-	-	-	10,000,000.00
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	45	49,715,000.00	-	-	-	49,715,000.00
මහජන බැංකුව	47	10,000,000.00	-	-	-	10,000,000.00
එකතුව		**69,715,000.00**	**16,000,000.00**	**320,204,712.63**	**98,991,000.00**	***504,910,712.63***

මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය සඳහා සටහන් අංක 13-2

2021 දෙසැම්බර් 31 දිනට ණයදෙන ආයතනවලින් ලැබිය යුතු සේවා ගාස්තු

ආයතනය	ලෙජර් පිටු අංක	ගණන රු.
ලංකා බැංකුව	21	400,000.00
මහජන බැංකුව	23	150,000.00
රාජ්‍ය උකස් හා ආයෝජන බ	25	200,000.00
ලංකා බැංකුව - නිවාස - නව	29	1,077,690.82
ලංකා බැංකුව - ස්වයං රැකියා - නව	31	4,501,348.49
එකතුව		***6,329,039.31***